# ලංසු සඳහා ආරාධනයයි

# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## කොළඹින් පිටත දුම්රිය ස්ථාන පරිශ්‍රවල පිහිටි පහත සඳහන් බඩු ගබඩා ගොඩනැගිලි භාණ්ඩ ගබඩා කිරීමට හෝ ව්‍යාපාර කටයුත්තක් සඳහා වසර 05කට බදු ලබාදීම සඳහා ලංසු කැඳවීම.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කොළඹින් පිටත පිහිටි පහත බඩු ගබඩා වසර පහක කාලයකට භාණ්ඩ ගබඩා කිරීමට හෝ ව්‍යාපාරික කටයුත්තකට බදු ලබාදීම පිණිස ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| අනු අංකය | ගබඩාව පිහිටි ප්‍රදේශය | ප්‍රමාණය (වර්ග අඩි) | අනු අංකය | ගබඩාව පිහිටි ප්‍රදේශය | ප්‍රමාණය (වර්ග අඩි) |
|---|---|---|---|---|---|
| 1 | හපුතලේ I | 1260 | 15 | ත්‍රිකුණාමලය | 1800 |
| 2 | හපුතලේ II | 1100 | 16 | හික්කඩුව | 800 |
| 3 | හපුතලේ III | 700 | 17 | මාතර | 2250 |
| 4 | හපුතලේ IV | 600 | 18 | හලාවත | 2592 |
| 5 | හපුතලේ විශ්‍රාමශාලා ගොඩනැගිල්ල | 1593 | 19 | මාදම්පෙ | 1960 |
| 6 | හාලිඇල | 861 | 20 | මීරිගම | 1711 |
| 7 | උලපනේ | 960 | 21 | ශ්‍රාවස්තිපුර I | 610 |
| 8 | පානදුර | 1765 | 22 | ශ්‍රාවස්තිපුර II | 204 |
| 9 | හිඟුරක්ගොඩ | 1000 | 23 | ශ්‍රාවස්තිපුර III | 204 |
| 10 | අනුරාධපුර | 1050 | 24 | නාත්තන්ඩිය | 1200 |
| 11 | බදුල්ල | 891 | 25 | මාතලේ I | 1155 |
| 12 | ගලබඩ | 1800 | 26 | මාතලේ II | 356 |
| 13 | බලපිටිය | 989 | 27 | පොලොන්නරුව | 4680 |
| 14 | කැකිරාව | 1800 | | | |

**01.සුදුසුකම්**

දෙපාර්තමේන්තු කොන්දේසි වලට යටත්ව වඩාත් සුදුසු මිලදීමනාකරුට අදාල බඩු ගබඩා බදු ලබාදීමට කටයුතු කරනු ඇත.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ටෙන්ඩර් අයදුම්පත් ලියවිලි 2024 සැප්තැම්බර් මස 25 වන දින ප.ව.2.00 දක්වා දුම්රිය වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් හෝ අදාල දුම්රිය ස්ථාන වෙතින් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරී වෙත හෝ දුම්රිය ස්ථානාධිපති වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු. 2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත හෝ අදාල දුම්රිය ස්ථානය වෙත හෝ ඉදිරිපත් කළ යුතුය. ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක් ද ගෙවිය යුතුය. එක් ලංසු පෝරමයක් මගින් ලංසු ඉදිරිපත්කල හැක්කේ එක් බඩු ගබඩාවක් සඳහා පමණි.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "ගබඩාවේ නම හා වර්ග අඩි ප්‍රමාණය සඳහන්කර දුම්රිය බඩු ගබඩා ගොඩනැගිලි සඳහා සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2024 සැප්තැම්බර් මස 26 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි අංශය, දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේ දී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම**

2024 සැප්තැම්බර් මස 26 වන දින ප.ව.2.00ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේ දී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් බඩු ගබඩා පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන්හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා අදාල දුම්රිය ස්ථානාධිපති වෙතින් අවසර ලබා ගත යුතු වේ.

**06.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**07.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) / 011-4600944 හරහා ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,<br>
දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10.